## ජාතික හැඳුනුම්පත සම්බන්ධයෙන් උපදෙස්

- සෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකුම ජාතික හැඳුනුම්පතක් ලබා ගත යුතුය.
- තම ජාතික හැඳුනුම්පත අවර්ණ වී, දුර්වර්ණ වී, පළුදු වී ඇත්නම් හෝ අපැහැදිලි වී ඇත්නම් නව ජාතික හැඳුනුම්පතක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ.
- නව ජාතික හැඳුනුම්පතක් සඳහා ඉල්ලුම්කරන සෑම විටම පැරණි ජාතික හැඳුනුම්පත, ඉල්ලුම්පත සමඟ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත භාර දිය යුතුය.
- අවසන් වරට ලබා ගත් ජාතික හැඳුනුම්පත නැතිවී ඇත්නම් පමණක් නැතිවූ බවට පොලිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.
- ජාතික හැඳුනුම්පත් 02ක් හෝ කිහිපයක් ළඟ තබා ගැනීම නොකළ යුතුය.
- ජාතික හැඳුනුම්පත මත පෑනෙන් ලිවීම දඬුවම් ලැබිය හැකි වරදකි.
- ජාතික හැඳුනුම්පත ලබා ගැනීම සඳහා එක් ඉල්ලුම්පතක් යොමු කර තිබියදී තවත් ඉල්ලුම්පතක් යොමු කිරීම නොකළ යුතුය.
- එක්දින සේවයෙන් ජාතික හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත් සහතික කළ දින සිට මාස 06ක කාලයක් තුළ එක්දින සේවය සඳහා යොමු කළ යුතුය.
- සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්හි සඳහන් තොරතුරු කපා හැරීම, මකා දැමීම, ටිපෙක්ස් කිරීම හෝ තම අභිමතය පරිදි වෙනස් කිරීම නොකළ යුතුය.
- ද්විත්ව පුරවැසිභාවය ලබාගෙන මාස 06ක් ඇතුළත ජාතික හැඳුනුම්පතෙහි සංශෝධිත පිටපතක් ලබා ගත යුතු අතර එම ඉල්ලුම්පත සමඟ ද්විත්ව පුරවැසි සහතිකය ඉදිරිපත් කළ යුතුය.
- ඉල්ලුම්පත සමඟ ඉදිරිපත් කරන උප්පැන්න සහතිකය , හිස් ප්‍රතිඵල ලේඛනය (RSR) හා අනෙකුත් ලේඛනවල සඳහන් තොරතුරු ඉල්ලුම්කරු විසින් වෙනස් කිරීම නොකළ යුතුය.

**පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් (වැ.බ )**

Scanned with CamScanner

එක් දින සේවාව

(මුල් වරට/සංශෝධන/අනුපිටපත්) ජාතික හැඳුනුම්පත් ලබා ගැනීම.

- එක් දින සේවාව වෙත ජාතික හැඳුනුම්පතක් ලබා ගැනීම සඳහා අයදුම්කරු විසින් සම්පූර්ණකර ග්‍රාමනිලධාරී විසින් සහතික කරන ලද ඉල්ලුම් පත්‍රය.

  - අවශ්‍ය ලේඛන

- උප්පැන්න සහතිකය/ අනුමාන වයස් සහතිකය/ හිස් ප්‍රතිඵල ලේඛනය.

- අනුමාන වයස් සහතික ඉදිරිපත් කිරීමේදී නම හා උපන් දිනය තහවුරු කිරීම සඳහා පහත ලේඛන අතරින් එකක් හෝ ඉදිරිපත් කළ යුතුය.පාසල්හැරයා මේ සහතිකය තහවුරු කරන ලද කේන්ද්‍රයක පිටපතක් පුරවැසි සහතිකය භෞතිස්ම සහතිකය පවුල් සහතිකයන් අනුමාන වයස් සහතිකය හිස් ප්‍රතිඵල ලේඛන ඉදිරිපත් කිරීමේදී නම උපන්දිනය හා උපන් ස්ථානයේ තහවුරු කිරීමට දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.නම හා උපන්දිනය සනාථ කිරීම සඳහා සාක්ෂි නොමැති අවස්ථාවකදී ඒ බව සඳහන් කරමින් ග්‍රාම නිලධාරි ගෙන් ලබා ගන්නා ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

- වයස අවුරුදු දහසයට වැඩි මුල්වරට ඉල්ලුම් කරන ඉල්ලුම්කරුවෙකු නම් නියමිත කාලය තුළ ජාතික හැඳුනුම්පතක් ලබාගෙන නොමැති බවට වන ග්‍රාම නිලධාරී හා ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කරන පූ.ලි.දෙ/මෙ/2/3 ආකෘතිය.
- අඩු ආදායම්ලාභියෙකු නම් පූ.ලි.දෙ/මෙ/2/5 ආකෘතිය.

සාමාන්‍යය සේවය

## <u>(මුල් වරට/සංශෝධන/අනුපිටපත්) ජාතික හැඳුනුම්පත් ලබා ගැනීම.</u>

- ජාතික හැදුනුම්පතක් ලබා ගැනීම සඳහා අයදුම්කරු විසින් සම්පූර්ණකර ග්‍රාමනිලධාරී විසින් සහතික කරන ලද ඉල්ලුම් පත්‍රය.

  ❖ අවශ්‍ය ලේඛන

- උප්පැන්න සහතිකය/ අනුමාන වයස් සහතිකය/ හිස් ප්‍රතිඵල ලේඛනය.

- අනුමාන වයස් සහතික ඉදිරිපත් කිරීමේදී නම හා උපන් දිනය තහවුරු කිරීම සඳහා පහත ලේඛන අතරින් එකක් හෝ ඉදිරිපත් කළ යුතුය.පාසල්හැරයා මේ සහතිකය තහවුරු කරන ලද කේන්දරයක පිටපතක් පුරවැසි සහතිකය හෞතිස්ම සහතිකය පවුල් සහතිකයන් අනුමාන වයස් සහතිකය හිස් ප්‍රතිඵල ලේඛන ඉදිරිපත් කිරීමේදී නම උපන්දිනය හා උපන් ස්ථානයේ තහවුරු කිරීමට දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කල යුතුය.නම හා උපන්දිනය සනාථ කිරීම සඳහා සාක්ෂි නොමැති අවස්ථාවකදී ඒ බව සඳහන් කරමින් ග්‍රාම නිලධාරි වෙතින් ලබා ගන්නා ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

- වයස අවුරුදු දහසයට වැඩි මුල්වරට ඉල්ලුම් කරන ඉල්ලුම්කරුවෙකු නම් නියමිත කාලය තුළ ජාතික හැඳුනුම්පතක් ලබාගෙන නොමැති බවට වන ග්‍රාම නිලධාරී හා ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කරන පු.ලි.දෙ/මෙ/2/3 ආකෘතිය.
- අඩු ආදායම්ලාභියෙකු නම් පු.ලි.දෙ/මෙ/2/5 ආකෘතිය.

Scanned with CamScanner

- පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ඡායාරූප ශාලාවකින් ලබාගත් ICAO ප්‍රමිතියෙන් යුතු ඡායාරූප.

- සංශෝධන ජාතික හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා අවසන් වරට ලබා ගත් ජාතික හැඳුනුම්පත.

- හැඳුනම්පත අස්ථානගත වී ඇත්නම් ඒ බව සඳහන් කර ලබාගත් පොලිස් වාර්තාව. (එහි දී නැතිවූ ජාතික හැඳුනුම්පත අංක දොළහ සහිත ජාතික හැඳුනුම්පතක් නම් පොලිස් වාර්තාවේ ද එම අංකයම සඳහන් කළ යුතුය.)

- ද්විත්ව පුරවැසිලාභියෙක් නම් ද්විත්ව පුරවැසි සහතිකයේ මුල් පිටපත සමග ඡායා පිටපත.

- ස්වාමිපුරුෂයාගේ නම, වාසගම, ලබාගන්නේ නම් විවාහ සහතිකයෙහි මුල් පිටපත සමග ඡායා පිටපතක්.(ලබාගත් ඇති නමක් ඉවත් කිරීම සඳහා දික්කසාද සහතිකය හෝ මරණ සහතිකය ඉදිරිපත් කළ යුතුය.)

- බෞද්ධ භික්ෂූන් වහන්සේලා ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේදී උප්පැන්න සහතිකයට අමතරව බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ නිකුත් කරනු ලබන සාමණේර සහතිකය, උපසම්පදා සහතිකය ඉදිරිපත් කළ යුතුය. කතෝලික ක්‍රිස්තියානි, හින්දු, ඉස්ලාම්, පූජකවරුන් සඳහා පූජ්‍ය/ ගරු යන්න ලබාදීම සඳහා ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුවෙන් හින්දු කටයුතු දෙපාර්තමේන්තුවෙන් මුස්ලිම් කටයුතු දෙපාර්තමේන්තුවෙන් පැවිදි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

- බෞද්ධ සිල්මාතාවන් සඳහා භික්ෂුණී යන නාමය ලබාදීම සඳහා රංගිරි දඹුලු පාර්ශවයේ නායක ස්වාමීන් වහන්සේගේ

Scanned with CamScanner

- බෞද්ධ සිල්මාතාවන් සඳහා භික්ෂුණී යන නාමය ලබාදීම සඳහා රංගිරි දඹුලු පාර්ශවයේ නායක ස්වාමීන් වහන්සේගේ අත්සන සහිත සාමණේරී සහතිකය හෝ උපසම්පදා සහතිකය ඉදිරිපත් කළ යුතුය. බෞද්ධ සිල් මාතාවන් සඳහා කතෝලික, ක්‍රිස්තියානි , හින්දු , ඉස්ලාම් කාන්තා පූජකවරියන් සඳහා පූජ්‍ය/ගරු යන්න ලබාදීම සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවෙන් ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුවෙන්, හින්දූකටයුතු දෙපාර්තමේන්තුවෙන්, මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුවෙන්, නිකුත් කරන ලද පැවිදි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

- මෙම ලේඛනවලින් අවශ්‍ය ලේඛන ග්‍රාම නිලධාරී මගින් සහතික කරගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හැඳුනුම්පත් අංශය වෙත පැමිණ ප්‍රාදේශීය ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම්ගේ බලය පැවරූ නිලධාරියෙකුගේ අනුඅත්සන සහිතව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත එක් දින සේවය වෙත යොමු විය යුතුය.

- ප්‍රධාන කාර්යාලය සුහුරුපාය , බත්තරමුල්ල හෝ වයඹ පළාත් කාර්යාලය, කුරුණෑගල වෙත රැගෙන යා යුතුය.

❖ එක් දින සේවය සඳහා ගාස්තු අයකිරීම.

- මුල්වරට ජාතික හැඳුනුම්පත නිකුත් කිරීම - රු. 200.00
- ජාතික හැඳුනුම්පත සංශෝධනය කිරීම සඳහා - රු. 500.00
- නැතිවූ ජාතික හැඳුනුම්පතක අනුපිටපතක් නිකුත් කිරීම - රු. 1000.00
- එක් දින සේවය සඳහා සේවා ගාස්තු - රු. 2000.00
- උචිත කාලය තුළ ජාතික හැඳුනුම්පත ලබා නොගැනීම සඳහා දඩ- රු.2500.00
- (අඩු ආදායම්ලාභියෙකු නම් රු.250.00)
- කලින් කලට රජය විසින් නිකුත් කරනු ලබන ගැසට් නිවේදන අනුව ගාස්තු සංශෝධනය විය හැක.

Scanned with CamScanner

අත්සන සහිත සාමණේරී සහතිකය හෝ උපසම්පදා සහතිකය ඉදිරිපත් කළ යුතුය. බෞද්ධ සිල් මාතාවන් සඳහා කතෝලික, ක්‍රිස්තියානි , හින්දු , ඉස්ලාම් කාන්තා පූජකවරියන් සඳහා පූජ්‍ය/ගරු යන්න ලබාදීම සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවෙන් ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුවෙන්, හින්දුකටයුතු දෙපාර්තමේන්තුවෙන්, මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුවෙන්, නිකුත් කරන ලද පැවිදි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

- මෙම ලේඛනවලින් අවශ්‍ය ලේඛන සහිතව ඉල්ලුම්පත ග්‍රාම නිලධාරී මගින් සහතික කරගෙන පෞද්ගලිකව පැමිණ හෝ ග්‍රාම නිලධාරී මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හැඳුනුම්පත් අංශය භාර නිලධාරියා වෙත භාර දිය යුතුය.

❖ සාමාන්‍යය සේවය සඳහා ගාස්තු අයකිරීම.

මුල්වරට ජාතික හැඳුනුම්පත නිකුත් කිරීම - රු. 320.00
ජාතික හැඳුනුම්පත සංශෝධනය කිරීම සඳහා- රු. 620.00
නැතිවූ ජාතික හැඳුනුම්පතක අනුපිටපතක් නිකුත් කිරීම -රු. 1120.00
උචිත කාලය තුළ ජාතික හැඳුනුම්පත ලබා නොගැනීම සඳහා දඩ- රු.2500.00
(අඩු ආදායම්ලාභියෙකු නම් රු.250.00)

<u>වැඩ පියවර</u>

- නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පරික්ෂා කර භාර ගැනීම.

⇓

- දින මුද්‍රාව තැබීම.

⇓

- අයදුම්පත් දෙපාර්තමේන්තු දත්ත පද්ධතියට එකතු කිරීම.

⇓

- ප්‍රාදේශීය ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම්ගේ බලය පැවරූ නිලධාරියෙකුගේ අනුඅත්සනට යොමු කිරීම.

⇓

- අයදුම්පත් පරිලෝකනය කිරීම හා ලේඛන පරික්ෂා කිරීම.

Scanned with CamScanner